# RESEARCH ABSTRACTS

## STUDENT RESEARCH SYMPOSIUM 2025

05th March 2026



ARCHIVAL & RESEARCH UNIT

# RESEARCH ABSTRACTS

# STUDENT RESEARCH SYMPOSIUM 2025

**ISBN 978-624-5785-38-4**

**Editor in Chief**

Senior Lecturer A.M.C Amarakoon

**Abstracts Reviewing**

Senior Professor Raj Somadeva

Senior Lecturer Manoj Sanjeewa

**Abstracts Editing**

Dr. Nissanka Abeyrathne

Senior Lecturer Kamalini Samarakoon

Senior Lecturer A.M.C Amarakoon

Mrs. Niluka Thilakarathne

**Book Cover**

Lecturer (Probationary) Samitha Rukmal Samarathunga

**Published By**

C.de.S Kulathilake Archival and Research Unit

Faculty of Music

University of the Visual and Performing Arts

No 21, Albert Cresent Colombo 07

**Conference Chair:** Snr. Lec. Sarath Fernando / Dean of the Faculty of Music

**Conference Chief Coordinator:** Senior Lecturer A.M.C Amarakoon

**Program Committee:**

Snr. Lec. AMC Amarakoon
Snr. Prof. Raj Somadeva
Prof. Saman panapitiya
Prof. Ruwin Dias
Dr. Mahesh Pathmakumara

**Conference Secretary:** Mrs. Niluka Thilakarathne

**Organizing Committee Members:**

Dr. Nissanka Abeyrathne

Senior Lecturer Mangalika rajapaksha

Senior Lecturer Indrani Edirisooriya

Senior Lecturer Ashoka Indunil

Senior Lecturer Kamalini Samarakoon

Senior Lecturer Manoj Sanjeewa

Senior Lecturer Kelum Kularathne

Senior Lecturer Charudatta Ilangasinghe

Senior Lecturer Asith Athapaththu

Lecturer Darshana Pramod

Lecturer Gayan Jayasinghe

Lecturer Samitha Samarathunga

Lecturer H.M.D.S. Herath

Dr. Manohari Randunuge

Mr. Harendra Deshapriya

Mr. Nandana Wijenama

Mr. Sachintha Maduranga

Mr. Rachika de Silva

Mr. Gayanath Dhahanayake

Mrs. Dhammika Kumari

Ms. Thushari Bolukandura

Mr. Dasun Nayanajith

Mrs. Shehani Nipunika

Mr. Buddika Jayatissa

Mr. Tharindu Wijerathne

Mr. Alagiyawanna

Mrs. Buddima Niyuni

## Contents


**VICE CHANCELOR'S MESSAGE** .................................................................... 9

**MESSAGE FROM THE DEAN** .................................................................... 10

**MESSAGE FROM THE DIRECTOR C.de.S KULATHILAKE ARCHIVAL AND RESEARCH UNIT** .................................................................... 11

**SESSION 01** .................................................................... 12

**ANTHROPOLOGICAL ASPECT OF CREATIVE ARTS (AACA)** .................... 12

**SESSION 02** .................................................................... 20

**MUSIC AND IT'S THERAPUTIC USAGE (MTU)** .......................................... 20

**SESSION 03** .................................................................... 28

**PEDAGOGICAL ASPECTS OF CREATIVE ARTS (PACA)** ............................. 28

**SESSION 04** .................................................................... 36

**EFFECTIVENESS OF AI & MARKETING APPLICATION ON MUSIC (EAM)** .................................................................... 36

## VICE CHANCELOR’S MESSAGE



**Prof. Rohan Nethsinghe**
Vice Chancellor - University of the Visual and Performing Arts

PhD (Monash University), MFA/BFA (Donetsk Conservatory, USSR), GradDipEd (Sec), BEd (H1) (Monash University), Dip in TAE, Dip in VET Prac, Dip VET (Chisholm TAFE, Australia)

It gives me immense pleasure to extend my warmest greetings to all participants of the Student Research Symposium 2025, Faculty of Music, organized by the C.de.S Kulathilake Archival and Research Unit under the theme *“Resonating Research in Music and Creative Arts.”*

Music and the creative arts are powerful mediums through which knowledge is explored, expressed, and transformed. Research in these fields goes beyond written scholarship; it resonates through performance, composition, innovation, cultural inquiry, and community engagement. This symposium reflects our university’s commitment to fostering research that is not only academically rigorous but also creatively vibrant and socially relevant.

I am particularly proud to see our students at the forefront of this scholarly and artistic exploration. Your work demonstrates that research in music and creative arts is both reflective and transformative bridging tradition and innovation, theory and practice, heritage and contemporary expression.

This symposium provides an invaluable platform for young researchers to share ideas, challenge perspectives, and collaborate across disciplines. It embodies the spirit of inquiry, creativity, and excellence that defines our institution.

I commend the Faculty of Music for organizing this significant academic event and for nurturing a culture where artistic practice and research mutually enrich one another.

I wish the symposium every success and trust that it will inspire meaningful dialogue, new discoveries, and enduring creative collaborations.

## MESSAGE FROM THE DEAN



**Snr. Lec.Sarath Fernando (BFA)**

Dean / Faculty of Music
University of the Visual and Performing Arts

I extend my sincere greetings on the occasion of the Student Research Symposium organized by the Faculty of Music through the C. de S. Kulathilake Archival and Research Unit.

As the academic home of our emerging musicians and scholars, the Faculty of Music remains deeply committed to fostering analytical thinking, artistic exploration, and research-based learning. This symposium stands as a testament to the dedication of our students and staff in cultivating a dynamic environment where performance and scholarship meaningfully intersect.

May this symposium continue to serve as a platform for dialogue, discovery, and academic growth within our Faculty. I sincerely appreciate the efforts of the C. de S. Kulathilake Archival and Research Unit, the academic staff, and the organizing committee whose commitment has made this symposium possible. I warmly congratulate our student presenters for their hard work and commend their willingness to contribute thoughtfully to the advancement of music scholarship.

# MESSAGE FROM THE DIRECTOR C.de.S KULATHILAKE ARCHIVAL AND RESEARCH UNIT



**Senior Lec. A.M.C Amarakoon**

Symposium Chief Co-Ordinator
C. de S. Kulathilake Archival and Research Unit
Faculty of Music
University of the Visual and Performing Arts

It is a privilege to present this message on the occasion of the Student Research Symposium organized by the C. de S. Kulathilake Archival and Research Unit of the Faculty of Music, in commemoration of the C. de S. Kulathilake Memorial.

The establishment of this Archival and Research Unit was inspired by the vision of preserving, documenting, and advancing scholarly work in the field of music. This symposium represents one of our key initiatives in fulfilling that mission. By creating a platform for students to present their research, we aim to encourage systematic inquiry, critical reflection, and meaningful academic discourse within the discipline.

Commemorating C. de S. Kulathilake through research-centered activities is especially significant. His legacy reminds us of the importance of documentation, preservation of musical heritage, and sustained scholarly engagement. It is our responsibility to ensure that this legacy continues to inspire future generations of musicians and researchers.

I extend my sincere appreciation to the Faculty of Music, the academic staff, and the organizing committee for their valuable support and collaboration. I also congratulate all participating students for their dedication and commendable research efforts.

# SESSION 01

# ANTHROPOLOGICAL ASPECT OF CREATIVE ARTS (AACA)

| TIME | SESSION 01: ANTHROPOLOGICAL ASPECT OF CREATIVE ARTS (AACA) | | |
|---|---|---|---|
| | SESSION CHAIR – SENIOR PROFESSOR RAJ SOMADEVA<br>SESSION CO-ORDINATORS: LEC. DARSHANA PRAMOD / LEC.GAYAN JAYASINGHE | | |
| 9.15 am | AACA - 01 | K. Ashini Chamodini | 1980-1990 දශකවල සිංහල ගීත සාහිත්‍යයේ සමාජ ප්‍රකාශනය පිළිබඳ විමසුමක්. |
| 9.30 am | AACA - 02 | E.G. Pahan Sandavinna | කතළුව පූර්වාරාමයේ බිතුසිතුවම් මඟින් නිරූපණය වන සමකාලීන සංගීතමය ලක්ෂණ |
| 9.45 am | AACA - 03 | H.M. Chandrakanthi Jayasekara | මහියංගණ වැදිපෙරහැරෙහි සංස්කෘතිකාංග අධ්‍යනයක් |
| 10.00 am | AACA - 04 | B.D.S.S. Wijesundara | මහනුවර යුගයේ දළදා කවිකාරමඩුවේ සංගීතය පිළිබද අධ්‍යයනයක්. |
| 10.15 am | AACA- 05 | A.W.A. Samadhi Nethmini Yatawathuwala | වී ගොවිතැනේ පළිබෝධ පාලනය සහ ජන කවියේ උපයෝගීතාව පිළිබඳ අධ්‍යයනයක් (කන්දේගම ග්‍රාමය ආශ්‍රයෙන්) |
| 10.30 am | AACA - 06 | A.L.A.C. Jayathri | ශ්‍රී ලංකාවේ ගීත නිර්මාණයේ විකාශනය සඳහා සමාජ සංස්කෘතික බලපෑම |

# 1980 - 1990 දශකවල සිංහල ගීත සාහිත්‍යයේ සමාජ ප්‍රකාශනය පිළිබඳ විමසුමක්.

කේ. අශිනි චමෝදිනී - Mu/19/ 091
සංගීතවිද්‍යා අධ්‍යයනාංශය, සංගීත පීඨය
ashinichamodini99@gmail.com

**සංක්ෂිප්තය**

සංගීතයේ භාවිත ධ්වනිය, විශ්වශක්තියක් බැවින් සංගීතය මානව සංස්කෘතිකය හා බැඳි විශ්ව ලක්ෂණයකි. 1980-1990 කාල පරිච්ඡේදය ඇසුරෙහි ශ්‍රී ලංකාවේ නිර්මාණය වූ ගීත, සමාජ ප්‍රකාශන මාධ්‍යයක් ලෙස ක්‍රියා කරන ආකාරය විශ්ලේෂණය කිරීම පර්යේෂණය මඟින් පෙන්වා දෙයි. තද් සමයේ සමාජ, දේශපාලන හා සංස්කෘතිකමය ලක්ෂණ හඳුනාගැනීම හා සමාජ කතිකාව සඳහා සංගීතයේ දායකත්වය පෙන්වාදීම මෙහිදී අවධානය යොමු කෙරේ. සමාජ සංස්කෘතික අනන්‍යතාව ගොඩනැංවීම, සමාජ සන්නිවේදනය හා ප්‍රතිකාරමය භාවිතය ආදී මානව විද්‍යාත්මක භූමිකා, 1980-1990 ගීත, සමාජ විශ්ලේෂණයෙහි මෙවළමක් ලෙස භාවිත වූයේ ද යන්න මෙම පර්යේෂණයේ මූලික ගැටලුව වේ. ”ගීතය යන්න පවතින සාමූහික ජන විඥානයේ හා සංස්කෘතික සමාජයට අනුරූපී වූ, සමාජ වාතාවරණයේ පිළිබිඹුවක්” යන්න මෙම පර්යේෂණයේ උපන්‍යාසයයි. සමාජ විද්‍යාත්මක විවරණයට යටත්ව මානවවංශ විෂය ක්ෂෙත්‍රයේ මූලාශ්‍රය හා ක්‍රමවේදයට අනුව අදාළ දශකයේ ගීත පහක් ඇසුරෙන් පර්යේෂණය මූලික වශයෙන් සිදු කෙරේ. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදවලට යටත්ව ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය මඟින් දත්ත රැස් කර ගැනීම සිදු කෙරේ. මාතෘකාව හා සබැඳි ග්‍රන්ථ පරිශීලනය, පර්යේෂණ වාර්තා හා ගී පද රචනා පිළිබඳ විද්වතුන් සමඟ පවත්වන සම්මුඛ සාකච්ඡා, සාහිත්‍ය විචාරක වැඩසටහන් මෙන්ම අන්තර්ජාලය, සඟරා හා ලිපි පරිශීලනය කිරීම සිදු කෙරේ. ගීතය හුදෙක් රසවින්දන මාධ්‍යයක් පමණක් ම නොව සමාජයීය, දේශපාලන, ආර්ථික හා සංස්කෘතික පරිසරය පිළිබිඹු කරන ප්‍රබල සමාජ ප්‍රකාශන මාධ්‍යයක් ලෙස නිගමනය කළ හැකි ය.

**මුඛ්‍ය පද:** සමාජ ප්‍රකාශනය, ගීතය, සංස්කෘතිකය, මානව විද්‍යාත්මක භූමිකා

## කතළුව පූර්වාරාමයේ බිතුසිතුවම් මගින් නිරූපණය වන සමකාලීන සංගීතමය ලක්ෂණ

ඊ.ජී.පහන් සඳවින්න - Mu /23/013
උත්තර භාරතීය සංගීත අධ්‍යනාංශය, සංගීත පීඨය
psandawinna@gmail.com

**සංක්ෂිප්තය**

ක්‍රි.ව. 1886 දී එනම් දහනව වන සියවසේ අග භාගයේ දී නිර්මාණය වූ විහාරස්ථානයක් ලෙස දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ පිහිටි කතළුව පූර්වාරාම විහාරය හඳුන්වාදිය හැකි අතර එම විහාරයේ බිතුසිතුවම් මගින් දහනව වන සියවසේ ශ්‍රී ලංකාවේ සමකාලීන සංගීතමය ලක්ෂණ හා එහි විශේෂතා හඳුනා ගැනීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. ඒ අනුව මෙම විහාර බිතුසිතුවම් මගින් දහනව වන සියවසේ ශ්‍රී ලංකාවේ සමකාලීන සංගීතමය තොරතුරු නිරූපණය වන්නේ ද යන්න පර්යේෂණ ගැටලුව වන අතර ”කතළුව විහාරස්ථානයේ බිතුසිතුවම් මගින් ශ්‍රී ලංකාවේ සමකාලීන සංගීතමය තොරතුරු නිරූපණය වේ” යන්න මෙහි උපන්‍යාසයයි. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ ක්ෂේත්‍ර අධ්‍යයනය, සාහිත්‍යගත මූලාශ්‍රය අධ්‍යයනයෙන් සහ සම්මුඛ සාකච්ඡා ඇසුරෙන් තොරතුරු එක් රැස් කෙරිණි. එකී දත්ත විග්‍රහයෙන් ඇතැම් සිතුවම්හි දේශීය සංගීත භාණ්ඩ හා බටහිර සංගීත භාණ්ඩ ද සිතුවම් ගත කොට ඇති බව දැක ගත හැකි විය. ඒ අනුව කතළුව පූර්වාරාම විහාරයෙහි ඇති මෙම විහාර බිතුසිතුවම් මගින් ශ්‍රී ලංකාවේ සමකාලීන සංගීතමය ලක්ෂණ මනා ලෙස නිරූපණය වන බව නිගමනය විය.

**මුඛ්‍ය පද:** මහනුවර යුගය, විහාර බිතුසිතුවම්, සංගීත භාණ්ඩ, සංස්කෘතිය

### මහියංගණ වැදිපෙරහැරෙහි සංස්කෘතිකාංග අධ්‍යයනයක්

එච්.එම්. චන්ද්‍රා කාන්ති ජයසේකර - Mu/21/210
මානවවංශ සංගීත අධ්‍යනාංශය, සංගීත පීඨය
chandusurangi3@gmail.com

**සංක්ෂිප්තය**

ශ්‍රී ලංකාවේ ආදිවාසී සංස්කෘතික උරුමය නිරීක්ෂණය කළ විට, මහියංගණ වැදි පෙරහැර විශිෂ්ට ආකෘතියක් ලෙස හඳුනාගත හැකිය. එය ආදිවාසී වැදි ජන සමාජයේ ආගමික, සමාජීය හා අසුරාණාත්මක විශ්වාසයන් ගැඹුරින් අර්ථ දැක්වෙන පාරම්පරික උත්සවයකි. මෙම පර්යේෂණයේ ප්‍රධාන ගැටලුව වූයේ මහියංගණ වැදි පෙරහැරෙහි අන්තර්ගත සංස්කෘතිකාංග කුමන මූලාශ්‍රයන්ගෙන් හා සංස්කෘතික පරිසරයන්ගෙන් ආවරණය වී ඇතිද යන්න තීරණය කිරීම ය. එම ගැටලුවට පිළිතුර සෙවීම සඳහා පර්යේෂණයේ අරමුණ වූයේ මෙම පෙරහැර තුළින් ප්‍රකාශ වන ආදිවාසී සංස්කෘතික අගයන්, සංකේත හා සමාජීය අර්ථයන් විද්‍යාත්මකව විග්‍රහ කිරීම ය. පර්යේෂණය ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ ක්‍රියාත්මක කරනු ලැබූ අතර, ප්‍රාදේශීය නිරීක්ෂණ, සම්මුඛ සාකච්ඡා හා ලේඛන විශ්ලේෂණ යොදා ගෙන දත්ත රැස් කරන ලදී. රැස්කළ දත්ත විශ්ලේෂණය සිදුකළේ සංස්කෘතික සංකේත විග්‍රහය සහ සමාජ අර්ථ නිරූපණ ක්‍රමවේද මත පදනම්ව ය. විශ්ලේෂණයෙන් අනාවරණය වූයේ පෙරහැරෙහි අන්තර්ගත වූ නර්තන රටා, වාදන, ඇඳුම් පැළඳුම්, ආයුධ, ගායන හා උත්සව රීති ආදිවාසී වැදි සංස්කෘතික අංගවල සජීව ප්‍රකාශයක් බව ය. එමඟින් වැදි සමාජයේ ආගමික ඇදහිලි, සමාජීය ඒකාබද්ධතාවය සහ පාරම්පරික උරුම සංරක්ෂණ අගයන් නවීන සමාජයෙහි ද තිරසාරව පවත්වාගෙන යාමට බලපාන බව තහවුරු විය. ඉන් අතිරේකව, මෙම පර්යේෂණය ආදිවාසී සංස්කෘතික උරුමය විද්‍යාත්මක පරිදි විග්‍රහ කිරීමේ නව මාවතක් හෙළි කරමින්, මහියංගණ වැදි පෙරහැර සංස්කෘතික උරුමයක් ලෙස සුරක්ෂිත කර ගැනීමට ප්‍රායෝගික යෝජනා ද ඉදිරිපත් කරයි.

**මුඛ්‍ය පද:** ආදිවාසී සංස්කෘතිය, මහියංගණ වැදි පෙරහැර, උරුම සංරක්ෂණය

## මහනුවර යුගයේ දළදා කවිකාරමඩුවේ සංගීතය පිළිබඳ අධ්‍යයනයක්

බී. ඩී. එස්. එස්. විජේසුන්දර - Mu/20/048
දක්ෂිණ භාරතීය සංගීත අධ්‍යනාංශය, සංගීත පීඨය
divyasandamini0818@gmail.com

**සංක්ෂිප්තය**

මහනුවර යුගයේ ක්‍රියාත්මක වූ කවිකාරමඩු අතරින් දළදා කවිකාරමඩුවේ භාවිත සංගීත සම්ප්‍රදාය පිළිබඳ අධ්‍යයනය පර්යේෂණයේ අරමුණ වේ. මහනුවර යුගයේ රාජසභා සහ දළදා කවිකාරමඩුවල සංගීතය අතර සම්බන්ධයක් පවතී ද යන්න පර්යේෂණයේ ගැටලුවයි. මෙම පර්යේෂණයෙන් මහනුවර යුගයේ දළදා කවිකාරමඩුවේ සංගීතයට කර්ණාටක සංගීතයේ ආභාෂය ලැබීම පිළිබඳ විමර්ශනය කෙරේ. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ පර්යේෂණය සඳහා තොරතුරු රැස් කරයි. අනාවරණය කර ගත් තොරතුරු අනුව දළදා කවිකාරමඩුවේ ගායනාවන් දේශීය ජන ගායනා ආභාෂයෙන් නිර්මාණය වී ඇති බව සනාථ විය. දළදා කවිකාරමඩුවේ ගායනා සඳහා රාජසභා කවිකාරමඩුවේ සංගීතයේ පැවැති කර්ණාටක සංගීත ආභාෂයක් සඳහා ලැබී නොමැති බව අනාවරණය විය.

**මුඛ්‍ය පදඃ** දළදා කවිකාරමඩුව, රාජසභා, කර්ණාටක සංගීතය, ජන සංගීතය

# වී ගොවිතැනේ පළිබෝධ පාලනය සහ ජන කවියේ උපයෝගීතාව පිළිබඳ අධ්‍යයනයක් (කන්දේගම ග්‍රාමය ආශ්‍රයෙන්)

ඒ.ඩබ්.ඒ. සමාධි නෙත්මිණී යටවතුවල - Mu/20/046
මානවවංශ සංගීතවිද්‍යා අධ්‍යනාංශය, සංගීත පීඨය
samadhinethmni0@gmail.com

**සංක්ෂිප්තය**

සංක්ෂිප්ත දැනුම් ගබඩාවක් ලෙස ජන කවිය සංරක්ෂණය කිරීමත් එමඟින් සන්නිවේදනය කෙරුණු විවිධ පළිබෝධ පාලන ක්‍රමවල ප්‍රායෝගික පලදායීතාව විශ්ලේෂණාත්මකව අනාවරණය කරමින් පරිසර සමතුලිතතාව රැකගැනීමට සමාජය යොමු කිරීමත් අරමුණු කර ගනිමින් මෙම පර්යේෂණ කාර්යය සිදු කරන ලදී. මෙහිදී පළිබෝධ පාලනයත් ජන කවියත් අතර සන්නිවේදන හුවමාරුව කෙසේ සිදු වී ඇත්දැයි සහ ජනකවියා ඉදිරිපත් කළ පළිබෝධ පාලන ක්‍රමවල වර්තමාන භාවිතය කෙසේදැයි අධ්‍යයනය කෙරේ. ඒ සඳහා තවමත් සාම්ප්‍රදායික ජීවන ක්‍රම අනුගමනය කෙරෙන උඩුදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කන්දේගම ග්‍රාමය, අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස උපයෝගී කරගැනිණ. පර්යේෂණය සඳහා ගුණාත්මක ක්‍රමවේදය යටතේ මානවවංශ විවරණ පර්යේෂණ ක්‍රමය යොදාගත් අතර දත්ත එක්රැස් කිරීම සඳහා ප්‍රධාන වශයෙන් සහභාගිත්ව නිරීක්ෂණ, සම්මුඛ සාකච්ඡා සහ ලිඛිත මූලාශ්‍රය යොදාගන්නා ලදී. දත්ත විශ්ලේෂණයේදී තේමාත්මක විශ්ලේෂණය මූලික කරගැනිණ. එහිදී එක්රැස් කරන ලද ජන කවි මූලික ක්‍රම 6 ක් ඇතුලුව පළිබෝධ පාලන ක්‍රම 10 ක් යටතේ වර්ගීකරණය කර විශ්ලේෂණය කරන ලදී. ඒ අනුව සන්නිවේදන මාධ්‍යයක් සතුවිය යුතු ලක්ෂණ සපුරාලමින් මානව සන්නිවේදන විධික්‍රමවලට අනුගත වෙමින් ජනකවිය, සාම්ප්‍රදායික වී ගොවිතැනේ පළිබෝධ පාලන විධි සන්නිවේදනය කර ඇති බව අනාවරණය විය. තවද පාරිසරික සමතුලිතතාව රැකගනිමින් වසවිසෙන් තොර ගොවිතැනක් උදෙසා ජනකවියා ඉදිරිපත් කළ සාම්ප්‍රදායික පළිබෝධ පාලන ක්‍රම ඇතැම් ගොවි සමාජ තුළ අවිච්ඡින්නව පවතින බවත් නාගරීකරණය නිසා එම පරිසර හිතකාමී ක්‍රම අතහැරෙමින් ක්ෂණික ක්‍රම වෙත ප්‍රජාව යොමුවෙමින් පවතින බවත් අනාවරණය විය. එබැවින් පරිසර සමතුලිතාව පිළිබඳ අවධානය යොමුව ඇති පසුබිමක සාම්ප්‍රදායික දැනුම් කෝෂයක් වූ ජනකවිය සංරක්ෂණය කරමින් ගොවියාටත් පරිසරයටත් හිතකර ස්වභාවික පළිබෝධ පාලන ක්‍රම ප්‍රායෝගික භාවිතය කෙරෙහි ගොවියා යොමු කිරීම කාලීන අවශ්‍යතාවකි.

**මුඛ්‍ය පද:** ජනශ්‍රැතිය, ජන කවිය, පළිබෝධ පාලනය, සන්නිවේදනය, වී ගොවිතැන

## ශ්‍රී ලංකාවේ ගීත නිර්මාණයේ විකාශනය සඳහා සමාජ සංස්කෘතික බලපෑම

ඒ. එල්. ඒ. සී ජයත්‍රි - Mu/19/135
මානවවංශ සංගීතවිද්‍යා අධ්‍යනාංශය, සංගීත පීඨය
Alac.jayathri@gmail.com

**සංක්ෂිප්තය**

ශ්‍රී ලාංකේය සරල ගීතවල විකාශනයේ ඓතිහාසික පසුබිම එහි සංස්කෘතික සන්දර්භය අධ්‍යයනයේදී හඳුනාගත හැකිය. එබැවින් අනුරාධපුර අවධියේ සිට පසුකාලීන අවධීන් සමග ගීතය සම්බන්ධ වී ඇති ආකාරය දැක්විය හැකි ය. ශ්‍රී ලාංකේය ගීත කලාවේ විකාශනය සඳහා සමාජ සංස්කෘතික බලපෑම් සෘජුවම සිදු වී ඇති ද යන්නත්, ඒ ආශ්‍රිත සංගීතමය මූලාශ්‍රය තිබේ ද යන්නත් විමසීම මෙම පර්යේෂණයෙහි ගැටළුව වේ. ශ්‍රී ලාංකේය ගීතය විවිධ සංසිද්ධි මධ්‍යයේ ඓතිහාසික වටිනාකම් එක් රැස්වීමෙන් ගොඩනැගී ඇති ආකාරයත්, එහි අතීත අවධීන් සමඟ වර්තමානයේ නිර්මාණාත්මක විකාශනයේ සම්බන්ධය අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ විය. එමෙන්ම මෙම පර්යේෂණයේ තක්සේරුකරණය ගුණාත්මක ක්‍රමවේදය භාවිත කරගනිමින් සිදුවිය. සම්මුඛ සාකච්ඡා, පුස්තකාල පරිහරණය යන දත්ත එක්රැස් කිරීමේ ක්‍රමවේද භාවිත කරගනිමින් දත්ත විශ්ලේෂණ ප්‍රතිඵල හඳුනාගත හැකි විය. විවිධ යුගවල පැමිණි චෝළ, හින්දු ආක්‍රමණ සහ යටත් විජිත යුගය යුරෝපීය සහ අප්‍රිකානු බලපෑම් සමඟ ශ්‍රී ලාංකේය සංගීතය සහ ගීත නිර්මාණ නව මුහුණුවරකින් හඳුනාගත හැකි වූ අතර ඉන්දියානු සංගීතය සහ කෆිරි (Kaffrinha), (Cantiga Ballad) සහ (Christian chantys) මගින් ශ්‍රී ලාංකේය ගීත නිර්මාණය සඳහා සෘජුවම භාවිත මූලාශ්‍රය කිහිපයක් බලපෑම් වී ඇති ආකාරය මෙම පර්යේෂණය මගින් තහවුරු කරගත හැකි විය.

**මුඛ්‍ය පද:** සංගීත මූලාශ්‍රය, යුග, ගීත නිර්මාණය

# SESSION 02

# MUSIC AND IT'S THERAPUTIC USAGE (MTU)

| TIME | SESSION 02: MUSIC AND IT'S THERAPUTIC USAGE (MTU) | | |
|---|---|---|---|
| | SESSION CHAIR: PROFESSOR CHINTHAKA MEDDEGODA<br>SESSION CO-ORDINATORS: SNR.LEC MANOJ SANJEEWA / MR. HARENDRA DESHAPRIYA | | |
| 11.00 am | MTU - 01 | Chenuli Kulatunga | Music as a Brief Stress-Reduction Strategy: An Experimental Study with Undergraduates |
| 11.15 am | MTU - 02 | H.M.H. Subanya Herath | පූර්ව ළමා වියේ දරුවන්ගේ මානසික සංවර්ධනය සඳහා සංගීතයේ උපයෝගීතාව. |
| 11.30 am | MTU - 03 | K.K.G.T. Kavindya Rupasinghe | අධික්‍රියාකාරී දරුවන්ගේ චර්යාව කෙරෙහි සංගීතයේ බලපෑම. |
| 11.45 am | MTU - 04 | R.B. Poorni Nimeshika | තබ්ලා වාදනය මිනිසා ගේ ශරීර සෞඛ්‍ය කෙරෙහි ඇති කරන බලපෑම පිළිබඳ අධ්‍යනයක්. |
| 12.00 pm | MTU - 05 | G. Sachithra Shriyanjalee | Exploring Music's Therapeutic Potential for Psychotic Patients |
| 12.15 pm | MTU - 06 | T.G. Gethmi N. Madiligama | The Role of Music in Improving Focus and Concentration |

# Music as a Brief Stress-Reduction Strategy: An Experimental Study with Undergraduates

Chenuli Kulatunga – Mu/21/097
Department of Western Music, Faculty of Music
chenukulatunga20@gmail.com

**Abstract**

This study investigates how a three-minute calming music break can reduce perceived stress and influence performance in music students during real academic assignments versus when compared with silence. A mixed-methods, between-subjects experimental design will be used with 20-25 first year undergraduates from the University of the Visual and Performing Arts. Participants will be randomly assigned to either a music group, listening to a three-minute calming instrumental track, or a silence group, resting quietly for three minutes. Stress will be measured before and after the intervention using a Visual Analog Scale (VAS 0-100). Assignment performance will be evaluated through instructor scores. Data will be analysed to compare stress reduction and performance between groups. It is expected that students in the music condition will show reductions in perceived stress compared to those in silence, while performance will remain stable or slightly improve. The findings aim to provide evidence for a simple, practical intervention that could be applied in academic and performance settings to support student well-being.

**Keywords:** Academic stress, Music intervention, Stress reduction, Students, Silence

**පූර්ව ළමා වියේ දරුවන්ගේ මානසික සංවර්ධනය සඳහා සංගීතයේ උපයෝගීතාව.**

එච්.එම්. හංසිනදී සුබන්යා හේරත් - Mu/22/002
උත්තර භාරතීය සංගීත අධ්‍යනාංශය, සංගීත පීඨය
Hansinadee2002@gmail.com

**සංක්ෂිප්තය**

වර්තමානයේ කුඩා දරුවන්ගේ මානසික සංවර්ධනය සඳහා "සංගීතය" භාවිත කරයි. සංගීතයේ බලපෑම කුඩා දරුවන්ගේ මානසික සංවර්ධනය සඳහා ඉවහල් වන්නේදැයි මෙම පර්යේෂණයේ ගැටලුව වේ. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ තෝරාගත් පෙර පාසලක සිසුන් මුණ ගැසී ඔවුන්ගේ ක්‍රියාකාරකම් වාර කිහිපයක් අධීක්ෂණය කිරීම, පෙරපාසල් ගුරුවරුන් හා දෙමාපියන් සමඟ සම්මුඛ සාකච්ඡා කෙරිණි. ප්‍රාථමික හා ද්විතික දත්ත ලෙස පර්යේෂණ කෘති, පොත්පත් , සම්මුඛ සාකච්ඡා මගින් එක් රැස්කළ දත්ත විශ්ලේෂණය කරනු ලැබිණි, ප්‍රමාණාත්මක හා ගුණාත්මක පර්යේෂණ විධික්‍රම භාවිත කරමින් මිශ්‍ර ක්‍රමවේදය යටතේ මෙම පර්යේෂණය සිදු කෙරිණි. දරුවන්ගේ මානසික සංවර්ධනය සඳහා ළමා ගීත නාදමාලාවල බලපෑම අධ්‍යයනය කිරීම, කුඩා දරුවන්ගේ ආත්ම විශ්වාසය සහ නිර්මාණශීලීත්වය වර්ධනයට සිදුවන බලපෑම හා දරුවන්ගේ මානසික ව්‍යාකූලතා මඟහැර ගැනීමට සංගීතය කෙතරම් ඉවහල් වන්නේ ද යන්න පර්යේෂණ අරමුණු වේ. ළමා මානසික සංවර්ධනය යනු පරිසරය සහ අත්දැකීම් සමග නිර්මාණයවන ක්‍රියාවලියක් බැවින් සංගීතය සමග මුසු වූ අධ්‍යාපනික ක්‍රමවේදයක් හරහා දරුවන්ගේ මනෝභාවය පාලනය කිරීම සහ ඔවුන් සන්සුන් කිරීම ටත් සාර්ථක ඉගෙනුම් ක්‍රියාවලියක් වෙත ඔවුන් ගෙන යාමටත් ළමා මානසික සෞඛ්‍ය සංවර්ධනය සඳහාත් සංගීතය වඩාත් යෝග්‍ය වන බවත් නිගමනය කළ හැකි ය.

**මුඛ්‍ය පදඃ** පූර්ව ළමා වියි, ළමා ගීත, මානසික සංවර්ධනය, අධ්‍යයන ක්‍රියාවලිය

**අධික්‍රියාකාරී දරුවන් ගේ චර්යාව කෙරෙහි සංගීතයේ බලපෑම.**

කේ. කේ. ජී. තරුෂි කාවින්ද්‍යා රූපසිංහ - Mu/20/015
මානවවංශ සංගීතවිද්‍යා අධ්‍යනාංශය, සංගීත පීඨය
rupasinghetharushi03@gmail.com

**සංක්ෂිප්තය**

සංගීතය ළමා චර්යාවට බලපායි. අධික්‍රියාකාරී දරුවන් විෂයෙහි කරන ලද මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ අධික්‍රියාකාරී දරුවන්ගේ චර්යා වෙනස්වීමට සංගීතයේ බලපෑම පරීක්ෂා කිරීමයි. තවද, එම දරුවන්ට ඖෂධ නොවන ප්‍රතිකාරයක් ලෙස සංගීතය යොදා ගැනීම පිළිබඳව ද අධ්‍යයනය කිරීම මෙහි අරමුණකි. මෙම පර්යේෂණයේ ගැටළුව වූයේ අධික්‍රියාකාරී දරුවන්ගේ චර්යාවට සංගීත ක්‍රියාකාරකම් බලපාන්නේ කෙසේද යන්නයි. මෙම පර්යේෂණය ගුණාත්මක දත්ත මත පදනම් වී ඇත. එහිදී තොරතුරු රැස් කිරීම සහභාගිත්ව නිරීක්ෂණ සහ සම්මුඛ සාකච්ඡා මඟින් සිදු කර ඇත. පර්යේෂණයේ නියැදියට වයස අවුරුදු 10ත් 13ත් අතර අධික්‍රියාකාරී දරුවන් දසදෙනෙකු යොදාගෙන ඇත. දත්ත විශ්ලේෂණය තේමාත්මක විශ්ලේෂණය ඔස්සේ සිදු කර ඇත. මෙහි දත්ත විශ්ලේෂණයේදී තහවුරු වූයේ අධික්‍රියාකාරී දරුවන්ගේ චර්යාවල කෙටි කාලීන වෙනසක් සිදු කිරීමට සංගීත ක්‍රියාකාරකම් බලපාන බවයි. ඒ අනුව අධික්‍රියාකාරී දරුවන්ගේ චර්යාවල කල්පවතින වෙනසක් නිරීක්ෂණය කිරීමට එම දරුවන් සංගීත ක්‍රියාකාරකම්වල යොදවන කාලය දීර්ඝ කළ යුතු බව නිර්දේශ කළ හැකිය.

**මුඛ්‍ය පදඃ** චිකිත්සක සංගීතය, අධික්‍රියාකාරී දරුවන්, චර්යාත්මක වෙනස්කම්

**තබ්ලා වාදනය මිනිසා ගේ ශරීර සෞඛ්‍ය කෙරෙහි ඇති කරන බලපෑම පිළිබඳ අධ්‍යයනයක්.**

ආර්.බී. පූර්ණි නිමේශිකා. - Mu/20/013
උත්තර භාරතීය සංගීත අධ්‍යනාංශය, සංගීත පීඨය
Poorninimeshika1121@gmail.com

**සංක්ෂිප්තය**

තබ්ලා වාදනයේ දී හෘද ස්පන්දනය හා ඒ ආශ්‍රිත ඉන්ද්‍රීන් ගේ සිදුවන ක්‍රියාකාරීත්වය මෙන්ම දීර්ඝකාලීනව තබ්ලා වාදනයේ දී මිනිස් සිරුරේ සන්ධි හා පේශිවල ක්‍රියාකාරීත්වය අධ්‍යනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණයි. තබ්ලාව වාදනය කිරීමේ දී මිනිස් සිරුරට භෞතිකව හා ජීව විද්‍යාත්මකව බලපෑමක් ඇතිවන්නේ ද යන්න මෙහි ගැටළුවයි. වාදකයන් ස්ථිතික ඉරියව්ව භාවිත කරමින් දීර්ඝකාලයක් වාදනයේ යෙදීම හා අවිධිමත් ආසන ක්‍රම අනුගමනය කරමින් වාදනයේ යෙදීම මඟින් වාදකයාගේ භෞතික හා ජීව විද්‍යාත්මක වෙනස්කම් ඇති වේ. මෙම පර්යේෂණය ගුණාත්මක මෙන්ම ප්‍රමාණාත්මක දත්ත මත පදනම් වී ඇත. නාඩි ශීඝ්‍රතාවය හා රුධිර පීඩනය ආශ්‍රිතව ලබාගත් පාඨාංක මෙන්ම අවම වශයෙන් වසර තුනක පමණ කාලයක් අඛණ්ඩ පළපුරුද්දක් සහිත ශාස්ත්‍රීය තබ්ලා වාදකයන් සමග සිදු කරන ලද සම්මුඛ සාකච්ඡා හා ප්‍රශ්නාවලී ආශ්‍රයෙන් මෙම පර්යේෂණයේ ප්‍රධානතම දත්ත එක් රැස් කරගන්නා ලදි. බොහෝ තබ්ලා වාදකයින් තමා කායිකව විඩාවට පත් වී ශාරීරික වේදනාව ඇතිවන තෙක්ම පුහුණුවීම් සිදුකර ඇත. එසේම දීර්ඝ කාලීනව ශරීර සෞඛ්‍ය පිළිබඳ, ඉරියව් පිළිබඳ නොතැකීම හා විවේක නොගැනීම මඟින් අස්ථි හා පේශි පද්ධතිය ආශ්‍රිතව පීඩා ඇතිවීමේ නැඹුරුතාවයක් ඇතිවිය හැක. එම නිසා මෙම සොයාගැනීම් මඟින් පුහුණුවීම් හා විවේකය සමතුලිතව ලබා ගැනීමත්, ඉලක්කගත භෞතචිකිත්සක ව්‍යායාම (Physiotheraphy) ක්‍රම භාවිතයත් මඟින් ශාරීරික පීඩා ඇතිවීමේ හැකියාව අඩු කළ හැකි බව යෝජනා කළ හැකි ය.

**මුඛ්‍ය පදඃ** තබ්ලා වාදනය, භෞතචිකිත්සක ව්‍යායාම, සතත අභ්‍යාස

# Exploring Music's Therapeutic Potential for Psychotic Patients

G. Sachithra Shriyanjalee - Mu/20/01
Department of Musicology, Faculty of Music
sachishriyanjali2000@gmail.com

**Abstract**

Music has been recognized as a therapeutic tool for centuries, with Aristotle and Plato highlighting its value more than 2,000 years ago. In modern medicine, music therapy has proven effective in addressing physical, emotional, cognitive, and social needs across diverse settings such as hospitals, schools, nursing homes, and rehabilitation centers. It has been successfully applied to treat conditions including depression, anxiety, Parkinson's disease, and dementia, and is particularly beneficial for geriatric patients. This study extends the exploration of music therapy to psychotic patients at the Psychology Life Center in *Kohuwala,* in Sri Lanka. It focuses on both it's benefits and limitations. The research was designed to investigate the impact of music activities on anxiety reduction, mood enhancement, and motivation among psychotic patients. It also sought to evaluate patients' subjective experiences of music therapy and its role in fostering well-being and a sense of control, while assessing its potential as an adjunctive treatment for symptom management and cognitive improvement. A mixed-methods approach was employed, combining quantitative and qualitative data. Participants engaged in structured music activities such as listening, singing, and rhythm-based exercises. Quantitative data were collected using standardized psychological scales administered before and after sessions, while qualitative insights were gathered through semi-structured interviews and observational notes. The analysis revealed that music activities significantly reduced anxiety levels and improved overall mood. Patients demonstrated increased motivation and engagement during therapy sessions, and qualitative findings indicated that 80% of participants reported enhanced well-being and a greater sense of control through music engagement. These results suggest that music therapy is a valuable non-pharmacological complement to traditional treatments, offering psychosocial support and contributing to cognitive improvement in psychotic patients.

**Keywords:** Music Therapy, Psychotic Patients, Symptom Management, Cognitive Improvement, Dimentia

## The Role of Music in Improving Focus and Concentration

T.G. Gethmi N. Madiligama - Mu/21/087
Department of Western Music, Faculty of Music
gethminavodya1999@gmail.com

### Abstract

Music is increasingly recognized as a useful tool for enhancing focus, concentration, and productivity, especially among young adults in academic and professional settings. This study aims to examine the role of music in improving attention and cognitive performance during study or work tasks. A quantitative research approach will be used, with data collected through a Google Form survey from 40 young adults aged 20 - 25. The sample will consist of third-year students from the Art Faculty of the University of the Visual and Performing Arts. The survey will include questions about participants' habits of listening to music while studying or working, their preferred music genres, and their perceptions of music's effect on concentration and task performance. Descriptive analysis will be conducted to identify patterns in music-listening habits, the types of music considered most effective, and overall views on music as a cognitive aid. It is expected that most participants use music to enhance focus, with instrumental, classical, or soft pop music perceived as particularly helpful. The study will also explore whether music serves as a motivator, stress reliever, or, at times, a distraction, providing a deeper understanding of its impact. The findings will contribute to the growing body of knowledge on how music can be strategically used in study and work environments to improve efficiency, mental engagement, and overall productivity.

**Keywords:** Music, Concentration, Cognitive Performance, Productivity

# SESSION 03

# PEDAGOGICAL ASPECTS OF CREATIVE ARTS (PACA)

| TIME | SESSION 03: PEDAGOGICAL ASPECTS OF CREATIVE ARTS (PACA) | | |
|---|---|---|---|
| | SESSION CHAIR: PROFESSOR SAMAN PANAPITIYA<br>SESSION CO-ORDINATORS: DR. MANOHARI RANDUNUGE / VISING LEC. SHEHANI NIPUNIKA | | |
| 1.15 pm | PACA - 01 | W.K. Oshani Nirmani | A study on time management in balancing sports participation and academic responsibilities among performing arts students |
| 1.30 pm | PACA - 02 | Nimesha Ayeshani Jayasinghe | The Influence of Vaccai Vocalises on the Technical and Expressive Development of Western Classical Voice Students |
| 1.45 pm | PACA - 03 | S.G.O.S. Rajasinghe | ජන-සංගීත සාරය උපයෝගීතාවයෙහි නිර්මාණාත්මක ක්‍රියාපරිපාටිය |
| 2.00 pm | PACA - 04 | Prabhath Malinga Jayasundara | එස්රාජයේ තත් දරණකයෙහි (Bridge) ව්‍යුහාත්මක වෙනස්කම් ධ්වනි නිෂ්පත්තියට සිදු කරන බලපෑම |
| 2.15 pm | PACA - 05 | K.A.M.S. Kasthuriarachchi | ශ්‍රී ලංකාවේ ජන සම්ප්‍රදාහිත ගීතයේ ආකෘතිය පිළිබඳ විමසුමක්. |
| 2.30 pm | PACA - 06 | P.W.S.M.M.L. Bandaranayaka | සිංහල අනුකාරක චිත්‍රපටවල සංගීත අනුවර්තන උපක්‍රම |

**A study on time management in balancing sports participation and academic responsibilities among performing arts students**

W.K. Oshani Nirmani - Mu/21/151
Department of Western Music, Faculty of Music
renici42@gmail.com

## Abstract

This study investigates the relationship between sports participation and time management among students in University of the Visual and Performing Arts, Sri Lanka. Students in music, dance, drama, and visual arts faculties typically have heavy academic schedules and workload, long practice hours, and frequent performance and academic responsibilities that may limit their participation in sports and physical activities. The research aims to examine how students spend their time on their studies, practice and sports, identify the challenges they face in allocating in both academic and sports, and examine the physical inactivity effects on their overall wellness and health. Data will be collected by questionnaires and interviews among undergraduate students among the Faculty of Music, Faculty of dance and drama, and Faculty of Visual Arts. The study will use mixed method approaches, statistics (quantitative) and thematic analysis (qualitative) in explaining the data and providing insight into sports participation patterns and time management strategies. The results of the study are expected to illuminate the importance of systematic time management and institutional support in promoting physical activity, and how it affects to a healthy life, lifestyle balance, and performance capacity of aesthetic students. The research may give suggestions for university administrators to encourage a healthier, more balanced approach towards extracurricular commitments with academic responsibilities.

**Keywords:** Academic responsibilities performance capacity, Time management, Sports participation

**The Influence of Vaccai Vocalises on the Technical and Expressive Development of Western Classical Voice Students**

Nimesha Ayeshani Jayasinghe
Department of Western Music, Faculty of Music
nimeshaayeshani1999@gmail.com

**Abstract**

Western Classical singing requires both technical skill and expressive ability, including control of pitch, breath, tone, and emotional communication. Vaccai vocalises have long been used to develop these skills, but little research has explored their current effectiveness or how teachers apply them in lessons within Sri Lanka. This study aims to document the impact of Vaccai vocalises on the technical and expressive development of Western classical singing from the perspectives of students and teachers. Participants will include 15 advanced students and 5 experienced teachers, both local and foreign, selected for their expertise in classical singing and Vaccai exercises. A qualitative approach will be used, collecting data through semi-structured interviews and focus groups discussions. Data will be analyzed using thematic analysis to identify patterns in participants' experiences. The study focuses on improvements in technical skills, such as legato, pitch accuracy, vowel clarity, and breath control, as well as expressive skills, including phrasing, dynamics, musicality, and emotional expression. The findings are expected to provide practical and pedagogically informed guidance for integrating Vaccai exercises into modern Western classical voice training.

**Keywords:** Expression, Vaccai vocalises, Vocal pedagogy, vocal techniques, Western classical singing

## ජන-සංගීත සාරය උපයෝගීතාවයෙහි නිර්මාණාත්මක ක්‍රියාපරිපාටිය

එස්.ජී.ඕ.එස් රාජසිංහ - Mu/19/025
මානවවංශ සංගීතවිද්‍යා අධ්‍යනාංශය, සංගීත පීඨය
shanakarajasinghe7@gmail.com

**සංක්ෂිප්තය**

ගෝලීයව විවිධ ජන සාමූහිතයන්ගේ අනන්‍ය සංස්කෘතිකත්ව ලක්ෂණයක් ලෙස ස්ථාපිත ජන සංගීතය මගින් බිහි වූ මානවවංශ සංගීත විද්‍යාවේ පර්යේෂණාත්මක ක්ෂේත්‍ර පිළිබඳ අධ්‍යයනයෙහි නියැළීමෙන් එහි නූතන මානයන් අවබෝධ කර ගැනීම උදෙසා නිශ්චිත ක්‍රියාපරිපාටියක් අවශ්‍යව ඇත. මෙනයින් හඳුනාගන්නා අස්පර්ශනීය කලා උරුමයේ ආවේණික බව සංරක්ෂණය කරගනිමින් ශිල්පීය නිපුණත්වය හා දැනුම් පද්ධති සුභාවිතව හසුරුවාලීම හරහා නිමැවුම් සැකසීම සඳහා ක්‍රමවේද සැලසීම දැනුදු ව්‍යවහාරව පවතින්නකි. නිරතුරු ප්‍රායෝගිකත්ව මනෝ කුසලතා මෙහෙයවීම අත්‍යන්ත වශයෙන් වැදගත් ගුණාංගයක් ලෙස විෂය මූලික න්‍යායාත්මක විවරණයන් සහිත අර්ථකථන ඉදිරිපත් කිරීමත් සිද්ධාන්තමය පරිපාටියක් හරහා මානවවංශ ලේඛ්‍යයක් ගොඩනැගීමත් මින් අවධාරණය කරයි. ලොව පුරා සංගීත සම්ප්‍රදායන්හි කලාපීය විවිධත්වය කලාත්මක දෘෂ්ටිකෝණයකින් මිශ්‍ර කිරීම ඔස්සේ නවෝත්පාදනයන් සහ නව සම්මතයන් මතුවීම එහි සාධනීය ප්‍රවණතාවයක් වේ. තත්කාලීනව ශ්‍රවණයවන සංඛ්‍යාතයන් චිත්‍රණය කළ හැකි සන්නිවේදන භාෂාවක් මාධ්‍යයෙන් සංගීත සංරචනා ලෙස සංකේතාත්මකව නිරූපණය කිරීමට ඇති ශක්‍යතාවය සේ ම සංගීත කෘතියක් බිහිවීමට නම් ව්‍යුහාත්මක ආකෘතියක් සැකසිය යුතු වේ. ඒ අනාගතවාදී පැතිකඩකින් දාර්ශනික චින්තනය හසුරුවා සිදු කරන ජන සංගීත සාරිත නිර්මාණකරණය පාරිභාෂිත වූ නූතන දර්ශන වාදයේ දිශානතීන් මානව කේන්ද්‍රණවාදයේ ප්‍රගතිය හා සම්බන්ධතාවය ප්‍රවර්ධනය කරගනිමින් මානව යහජීවනය සඳහා ගැඹුරු අධ්‍යාත්මික වටිනාකමක් සහිතව පෝෂණය අවැසිම ප්‍රමුඛතාවක් වන බැවිනි.

**මුඛ්‍ය පදඃ** ජනසංගීත සාරය, නිර්මාණකරණය

# එස්රාජයේ තත් දරණකයෙහි (Bridge) ව්‍යුහාත්මක වෙනස්කම් ධ්වනි නිෂ්පත්තියට සිදු කරන බලපෑම

ප්‍රභාත් මාලිංග ජයසුන්දර - Mu/21/285
උත්තර භාරතීය සංගීත අධ්‍යනාංශය, සංගීත පීඨය
prabhath20malinga@gmail.com

**සංක්ෂිප්තය**

ශික්ෂණය, විනය, මානසික ඒකාග්‍රතාවය දියුණු කරන කලා මාධ්‍යක් ලෙස උත්තර භාරතීය සංගීතය මූලික වශයෙන් හැඳින්විය හැකිය. එකී සංගීත ශානරයෙහි සුවිශේසි නාදමය ගුනයක් සහිත වාද්‍ය භාණ්ඩයක් ලෙස එස්රාජය හඳුනාගත හැකිය. සංගීත භාණ්ඩයක් වශයෙන් එස්රාජයේ තත් දරණකය සැකසී ඇති ආකාරය, එස්රාජයේ නාද නිෂ්පත්තිය සඳහා තත් දරණකයේ බලපෑම පිළිබඳ අධ්‍යනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණයි. එස්රාජයේ නාද නිශ්පත්තිය සඳහා එස්රාජයේ තත් දරණකය නිර්මාණයට යොදාගන්නා අමුද්‍රව්‍ය සහ එහි හැඩයෙහි_ඇති වෙනස්කම් එහි ධ්වනි විවිධත්වයට බලපාන අයුරු කෙබඳු වේ ද යන්න මෙම පර්යේෂණ ගැටලුව වේ. ගුණාත්මක හා ප්‍රමාණාත්මක මිශ්‍ර විධික්‍රමය යටතේ මෙම පර්යේෂණය සිදු කෙරිණි. ද්විතීක දත්ත ලෙස පොත් පත්, සඟරා, ලිපි ලේඛන සහ ප්‍රාථමික දත්ත ලෙස සම්මුඛ සාකච්ඡා මඟින් දත්ත එක්රැස් කරන ලදී. දත්ත විශ්ලේෂණයට අනුව මෙම ධ්වනි නිෂ්පත්තිය සඳහා එහි ඇති තත් දරණකය ප්‍රධාන සාධකයක් වන බව නිගමනය කළ හැකිය. ඇත් දළ, සත්ත්ව අං සහ සත්ත්ව ඇටකටු මෙම තත් දරණකය නිර්මාණය සඳහා භාවිතා කරන අතර මේ සඳහා ලෝහ, ප්ලාස්ටික් වැනි ආදේශක නුසුදුසු වන අතර එමඟින් තත් මත ඇති කරන කම්පන තරංග උරාගැනීමෙන් තොරව සම්පූර්ණයෙන්ම සම වෙත සම්ප්‍රේෂණය කිරීමට බාදා පමුණුව යි. ඒ අනුව එස්රාජයේ ව්‍යුහාත්මක වෙනස්වීම් මඟින් ඒ ඒ එස්රාජයෙන් නිපදවන ධ්වනියේ වෙනස්කම් ඇති වන බව නිගමනය කළ හැකිය.

**මුඛ්‍ය පදඃ** එස්රාජය, තත් දරණකය_, එස්රාජයේ සැකැස්ම, ධ්වනි විවිධත්වය

**ශ්‍රී ලංකාවේ ජන සම්ප්‍රදාහිත ගීතයේ ආකෘතිය පිළිබඳ විමසුමක්.**

කේ. ඒ. එම් කස්තුරිආරච්චි
මානවවංශ සංගීතවිද්‍යා අධ්‍යයනාංශය, සංගීත පීඨය
mekhalasudharshani545@gmail.com

**සංක්ෂිප්තය**

කලාව සෑමවිටම සම්ප්‍රදායය සහ නූතනත්වය යන කරුණු ද්විත්වය මත පදනම්වන ප්‍රපංචයකි. සම්ප්‍රදායයක් හෝ කලා ශිල්පයක් එහි මුල් සාරය රැක ගනිමින් නූතන ලෝකයට ගැළපෙන ආකාරයට නව මුහුණුවරකින් ඉදිරිපත් කිරීම සඳහා නිර්මාණකරුවන් විසින් නව නිර්මාණ හා ප්‍රතිනිර්මාණ විධික්‍රම භාවිත කරයි. එම ක්‍රියාවලියේ දී සාම්ප්‍රදායික වටිනාකම් ආරක්ෂාවන ආකාරය පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයෙහි අරමුණ විය. නිර්මාණකරුවෙකුගේ නූතන දෘෂ්ටිවාදය සම්ප්‍රදායය රැක ගැනීම සඳහා බලපාන්නේ ද යන්න මෙම පර්යේෂණයේ ගැටලුව යි. නිර්මාණකරුවෙකුගේ නූතනවාදී දැක්ම නිර්මාණකරණයෙහිලා සූක්ෂම ආකාරයෙන් භාවිත කර ඇත යන්න ද මෙම පර්යේෂණයේ උපන්‍යාසයකි. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ මානවවංශ පර්යේෂණ ක්‍රමයට අනුව අධ්‍යයනය සිදු කෙරුණි. පුස්තකාල පරිහරණය, විද්‍යුත් මූලාශ්‍රය පරිහරණය, ජනතා සමීක්ෂණය සහ සම්මුඛ සාකච්ඡා යන දත්ත එක්රැස් කිරීමේ ක්‍රමවේද අනුගමනය කෙරිණි. නිර්මාණ කටයුතු සිදු කිරීමේ දී නව සංගීත සුසංයෝජනය, නව තාක්ෂණික මෙවලම් භාවිතය, ශ්‍රී ලාංකේය ජන ගී සම්ප්‍රදායය කෙරෙහි ධනාත්මක ලෙස හා ඍණාත්මක ලෙස ද බලපෑම් ඇති කරන බව අනාවරණය විය. ජන ගීතවල සරළ බව, අව්‍යාජත්වය සහ ඒවායෙහි ගැඹුරු අරුත ආරක්ෂා කර ගනිමින් ජන ගීයෙහි මුල් ස්වරූපය විකෘති නොකොට ඒවාට නව ජීවයක් ලබා දිය යුතු බව හා එවැනි කලාකෘති බිහි කිරීම සඳහා නිර්මාණකරුගේ නූතනවාදී දැක්ම සූක්ෂම ආකාරයෙන් භාවිත කර ඇති බව මෙම පර්යේෂණයේ දී තහවුරු විය.

**මුඛ්‍ය පදඃ** සම්ප්‍රදායය, නූතනත්වය, ජන ගී ආශ්‍රිත නිර්මාණ

## සිංහල අනුකාරක චිත්‍රපටවල සංගීත අනුවර්තන උපක්‍රම

පී.ඩබ්.එස්.එම්.එම්.එල්. බණ්ඩාරනායක - Mu/20/039
මානවවංශ සංගීතවිද්‍යා අධ්‍යයනාංශය, සංගීත පීඨය
pwsmmbandaranayaka@gmail.com

**සංක්ෂිප්තය**

මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන්නේ සමකාලීන සිංහල සිනමාවේ අනුකාරක චිත්‍රපටවල භාවිත සංගීතය, සංස්කෘතිය සමඟ අනුවර්තනය වීම පිළිබඳ අධ්‍යයනය කිරීමයි. විදෙස් චිත්‍රපට අනුකරණය කරමින් සිංහල භාෂාවට අනුවර්තනය වී ඇති චිත්‍රපටවල සංගීත නිර්මාණයෙහි භාවිත කරන ලද සංස්කෘතිකමය අනන්‍ය උපක්‍රම මොනවාද යන්න මෙහි විමර්ශනය කෙරේ. එහිදී සිංහල අනුකාරක චිත්‍රපටවල සංගීත අනුවර්තනයේ දී සංස්කෘතිය ප්‍රධාන සාධකයක් වන බවට අපේක්ෂා කෙරේ. ගුණාත්මක සහ ප්‍රමාණාත්මක යන මිශ්‍ර ක්‍රමවේද තුළ චිත්‍රපට දර්ශන විශ්ලේෂණය, සම්මුඛ සාකච්ඡා, සහ සමීක්ෂණ ඔස්සේ රැස්කරන ලද දත්ත විශ්ලේෂණයට භාජනය කෙරිණි. සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ සංගීතය හදාරන සිසුන් සහ ගුරුවරුන් පහළොස්දෙනෙකු වෙත පෙර සඳහන් කළ චිත්‍රපටවල සංගීතමය දර්ශන නැරඹීමට ලබාදීමෙන් යොමු කරන ලද ගූගල් පෝරමය ආශ්‍රයෙන් සංසන්දනාත්මක විශ්ලේෂණයක දත්ත ලබා ගත් අතර, සිංහල චිත්‍රපට දෙකෙහි සංගීත අධ්‍යක්ෂවරුන්ගෙන් සම්මුඛ සාකච්ඡා ලබා ගන්නා ලදී. චිත්‍රපට සංගීතය පිළිබඳ පර්යේෂකයාගේ දළ විශ්ලේෂණය ද ඇතුළුව තේමාත්මක විශ්ලේෂණයක් සිදු කෙරිණි. මෙම පර්යේෂණය තුළින් කරුණු කිහිපයක් තහවුරු විය. සිංහල අනුකාරක චිත්‍රපට සිංහල සංස්කෘතික පසුබිම තුළ පෝෂණය වෙමින් සංගීත ව්‍යුහයන්, ප්‍රභේද සහ වාද්‍ය භාණ්ඩ භාවිත කර ඇති අතර, කලාත්මක අංග මෙන්ම වාණිජ අංශ කෙරෙහි ද අවධානය යොමු කරමින් චිත්‍රපට සංගීතය අනුවර්තන සංකල්පය ඇසුරේ පෝෂණය වී ඇත. මුල් නිර්මාණවල සංගීතමය කාර්යභාරය හා සසඳන විට ගුණාත්මකභාවය වැඩි ප්‍රතිශතයක් මුල් චිත්‍රපට ලබා ගත්තත් ප්‍රේක්ෂක ඉල්ලීම තුළ සිංහල චිත්‍රපටය ඉදිරියෙන් විය. එනම් සිංහල සිනමාවේ සංගීත අනුවර්තනය සංස්කෘතික අනන්‍යතාව පිළිබඳ ක්‍රියාකාරී සාකච්ඡාවක් ඉදිරිපත් කරයි.

**මුඛ්‍ය පදඃ** සංස්කෘතික අනුවර්තනය, අනුකාරක චිත්‍රපට, සංගීත අනුවර්තන උපක්‍රම

# SESSION 04

# EFFECTIVENESS OF AI & MARKETING APPLICATION ON MUSIC (EAM)

| TIME | SESSION 04: EFFECTIVENESS OF AI & MARKETING APPLICATION ON MUSIC (EAM) | | |
|---|---|---|---|
| | SESSION CHAIR: DR. CHANAKA PEIRIS / PANEL MEMBER: SNR. LEC. CHANDRALAL AMARAKOON<br><br>SESSION CO-ORDINATORS: SNR. LEC. KELUM KULARATHNE / MR. GAYANATH DHAHANAYAKE | | |
| 3.00 pm | EAM - 01 | A.M.N. Wandana Athapatthu | Perceived Emotional Authenticity in Human versus AI-Composed Music |
| 3.15 pm | EAM - 02 | D.K.G.C.S. Wimalasena | පුද්ගල ආකල්ප පිලිබද රූපවාහිනි වෙළඳ දැන්වීම්කරණයේ බලපෑම |
| 3.30 pm | EAM - 03 | A.M. Thathsarani Prasadika Adhikari | ශ්‍රී ලාංකේය ගීත නිර්මාණකරුවන්ගේ බුද්ධිමය දේපළ හා ප්‍රකාශන හිමිකම් අවබෝධය පිළිබඳ විමර්ශනයක් |
| 3.45 pm | EAM - 04 | B.G.J.R. Sudarshani Perera | ව්‍යවහාරික සංගීතය සඳහා පහතරට බෙරය වාදනය කිරීමේ දී විධිමත් සංකේත ක්‍රමයක් හඳුන්වා දීමේ වැදගත්කම |
| 4.00 pm | EAM - 05 | P.A. Kushani Sanjana | The Role of Background Music in Commercial Advertisement |
| 4.15 pm | EAM - 06 | I.J.C. Tissera | දේශීය සිනමාවෙහි නිර්මාණාත්මක පරිවර්තනයක් සහ නිර්මාණාත්මක සමතුලිතතාවයක් පවත්වා ගැනීම සඳහා කෘත්‍රිම බුද්ධි තාක්ෂණය (AI) භාවිතය |

## Perceived Emotional Authenticity in Human versus AI-Composed Music

A.M.N. Wandana Athapatthu - Mu/21/232
Department of Western Music, Faculty of Music
wnimesha.athapatthu@gmail.com

**Abstract**

This study aims to investigate if there are observable differences in perceived emotional authenticity between pieces of music composed by a human composer and those composed by AI music generation. As we have seen artificial intelligence begin to take part in music composition, questions have arisen as to whether these pieces of music can express real emotionality or authenticity comparable to human creativity. Although AI as a compositional tool in the arts has become more common place, there has been little empirical study into this perceptual difference. To address this gap, this research will conduct a listening experiment with 10 undergraduate music students. Each student will evaluate a select sample of music excerpts across four emottional dimensions on a 5-point Likert scale, while listening to a sample of music. In the first part of the experiment, students will listen to the music without a source connection (the implied human composer vs AI composer), and in the second part students will listen to the same music after indicated whether it was suggested that a human or AI generated it. Data will be analyzed by running subsequent paired samples t-tests to determine any significance differences perceived emotionality between the two possible source indicated by the designated composition. Finding are expected to discover compelling evidence for further inquiry into emotion cognition in education in music and arts as broader implications of creativity and authenticity in relationship to technology and musical expression.

**Keywords**: AI or Human-Composed Music, Emotional Authenticity, Emotional Expression

## ශ්‍රී ලාංකේය ගීත නිර්මාණකරුවන් ගේ බුද්ධිමය දේපළ හා ප්‍රකාශන හිමිකම් අවබෝධය පිළිබඳ විමර්ශනයක්

ඒ.එම්.තත්සරණි ප්‍රසාදිකා අධිකාරි - Mu/19/139
මානවවංශ සංගීතවිද්‍යා අධ්‍යයනාංශය, සංගීත පීඨය
thathsaraniadikari@gmail.com

**සංක්ෂිප්තය**

බුද්ධිමය දේපළ හා ප්‍රකාශන හිමිකම් පිළිබඳ ශ්‍රී ලාංකේය නිර්මාණකරුවන්ගේ නො දැනුවත්භාවය හේතුවෙන් ගැටලු ඇති වූ අවස්ථා බොහෝමයක් ශ්‍රී ලාංකේය සමාජයේ දැකගත හැකි ය. නිර්මාණකරුවන් හා ශ්‍රී ලාංකේය ප්‍රජාව ප්‍රකාශන හිමිකම් නීතිය පිළිබඳ දැනුවත් කිරීම මෙම පර්යේෂණයේ අරමුණ විය. ශ්‍රී ලංකාවේ නව පරපුරේ සංගීත කර්මාන්තය හා සම්බන්ධ නිර්මාණකරුවන් සිංහල ගීතවලට අදාළ ප්‍රකාශන හිමිකම් නීති පිළිබඳ අවබෝධයෙන් කටයුතු සිදුකරනවාද යන්න මෙම පර්යේෂණයේ ගැටළුව විය. උපන්‍යාසය වූයේ ප්‍රකාශන හිමිකම් නීති පිළිබඳ නිර්මාණකරුවන් අවබෝධයකින් කටයුතු නො කරන බව යි. සමාජ විද්‍යාත්මක පර්යේෂණ සිද්ධාන්තවලට අනුගත ව ගුණාත්මක හා ප්‍රමාණාත්මක ක්‍රම ඒකාබද්ධ කර මිශ්‍ර ක්‍රමවේදය අනුව මෙම පර්යේෂණය සිදු කෙරිණි. මෙම පර්යේෂණය ශ්‍රී ලාංකේය ගීතයේ නෛතික පසුබිම පිළිබඳ වයස අවුරුදු 20 - 40 නිර්මාණකරුවන් ඇසුරින් සිදු කළ අතර ඒ සඳහා නිර්මාණකරුවන් 110 යොදා ගැනිණි. පුස්තකාල පරිහරණය, සම්මුඛ සාකච්ඡා, සමීක්ෂණ මගින් රැස්කළ දත්ත විශ්ලේෂණයෙන් ප්‍රතිඵල අත්පත්කොට ගැනිණි. එහි දී ප්‍රකාශන හිමිකම් උල්ලංඝනය වූ අවස්ථාවක පිරිසෙන් බොහෝ දෙනෙක් කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක් නො ගන්නා බව හෙළි විය. පර්යේෂණයට භාජනය වූ බහුතරයකට ප්‍රකාශන හිමිකම් බලාත්මක කිරීම පිළිබඳ ව මෙන් ම අයිතිවාසිකම් තේරුම් ගැනීමේ දී ඇතිවන ප්‍රධාන අභියෝග ලෙස අවබෝධය හා දැනුවත්භාවය නොමැතිකම, ප්‍රකාශන හිමිකම් නීතිය පිළිබඳ පැහැදිලි මාර්ගෝපදේශ නොමැති වීම, ප්‍රකාශන හිමිකම් නීතිය පිළිබඳ දැනුවත්වීමට ඇති මාර්ග අවම වීම සහ ගීතයේ නෛතික පසුබිම පිළිබඳ තොරතුරු සමාජයේ ව්‍යාප්ත ව නොතිබීම, නවකයන් ඇතුළු ව ක්ෂේත්‍රයේ බොහෝ දෙනාට ශ්‍රී ලාංකේය ගීතයේ බුද්ධිමය දේපොළ හා ප්‍රකාශන හිමිකම් පිළිබඳ අවබෝධයක් හෝ දැනුවත්භාවයක් නොමැතිවීම යන කරුණු මෙම පර්යේෂණයේ ප්‍රතිඵල ලෙස තහවුරු විය.

**මුඛ්‍ය පදඃ** ප්‍රකාශන හිමිකම්, බුද්ධිමය දේපළ, නෛතික පසුබිම, නිර්මාණකරුවන්

# ව්‍යවහාරික සංගීතය සඳහා පහතරට බෙරය වාදනය කිරීමේ දී විධිමත් සංකේත ක්‍රමයක් හඳුන්වාදීමේ වැදගත්කම

බී.ජී.ජේ.ආර්.සුදර්ශණී පෙරේරා - DD/20/224
වාද්‍ය සංගීත අධ්‍යයනාංශය, නර්තන හා නාට්‍ය කලා පීඨය
juleesharashunu@gmail.com

**සංක්ෂිප්තය**

ශ්‍රී ලංකාවේ ප්‍රචලිත එක් කලා අංගයක් වන සංගීත කලාව මිනිසාගේ හදවත ආමන්ත්‍රණය කරන්නකි. සංගීත කලාවේ එක් මාවතක් ලෙස සැලකෙන ව්‍යවහාරික සංගීතය සඳහා දේශීය භේරි වාද්‍ය භාණ්ඩයක් වන පහතරට බෙරය වාදනය කිරීම බහුල ව දැකගත හැකි ය. මෙම පර්යේෂණයේ ගැටලුව වන්නේ, ව්‍යවහාරික සංගීතය සඳහා පහතරට බෙරය වාදනය කිරීමේ දී විධිමත් සංකේත ක්‍රමයක් අවශ්‍ය වන්නේ ඇයි ද යන්නයි. ශ්‍රී ලංකාවේ ව්‍යාප්ත ව පවතින ව්‍යවහාරික සංගීතය සඳහා පහතරට බෙරය වාදනය කිරීමේ දී වාචික ව ඉදිරිපත් කරනු ලබන බෙර පදවලට වඩා සංකේතකරණයක් ඉදිරිපත් කිරීම වඩා ඵලදායී වේ යන්න උපන්‍යාසයකි. ගුණාත්මක සහ ප්‍රමාණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ සම්මුඛ සාකච්ඡා, ප්‍රශ්නාවලි මගින් දත්ත එක් රැස් කෙරිණි. ඒ අනුව ව්‍යවහාරික සංගීතය සඳහා පහතරට බෙරය වාදනය කළ පාරම්පරික වාදන ශිල්පීන් සමඟ සම්මුඛ සාකච්ඡා කරමින් සහ එම අධ්‍යයන ක්ෂේත්‍රයේ ප්‍රවීණයින් සහ ආධුනික ශිල්පීන් 25 දෙනෙකු තෝරාගෙන ව්‍යවහාරික සංගීතය සඳහා පහතරට බෙරය වාදනය කිරීමේ දී විධිමත් සංකේත ක්‍රමයක් සකස් කිරීම භාවිතයට පහසු වේ ද? නොවේ ද? යන්න ප්‍රශ්න ඇතුළත් ප්‍රශ්නාවලියක් බෙදා හරින ලදී. ඒ අනුව දත්ත විශ්ලේෂණයෙන් තහවුරු වූ කරුණු අනුව ව්‍යවහාරික සංගීතයේ දී පහතරට බෙරය වාදය කිරීම සඳහා විධිමත් සංකේතකරණයක් ලබා දීමේ දී ආධුනික වාදන ශිල්පීන්ට තම වාදන අංගය සංගීතය සමඟ නිවැරදි ආකාරයෙන් ගොනු කර ගැනීමේ හැකියාව ලැබෙන අතර සංකේතකරණය ඔස්සේ එය වඩාත් පහසු ලෙස නැවත නැවත පරිහරණය කිරීමේ හැකියාව පවතින බව කිව යුතු ය. දේශීය මෙන් ම විදේශීය වාදන ශිල්පීන්ට ද ව්‍යවහාරික සංගීතය සඳහා පහතරට බෙරය වාදනය කිරීමේ හැකියාව මෙමෙ සංකේතකරණය ඔස්සේ නිවැරදි ව සිදු කළ බව නිගමනය කෙරිණි.

**මුඛ්‍ය පදඃ** සංගීතය, ව්‍යවහාරික සංගීතය, පහතරට බෙරය, සංකේතකරණය

## The Role of Background Music in Commercial Advertisement

P.A. Kushani Sanjana - Mu/21/200
Western Music Department, Faculty of Music
kushanisanjana138@gmail.com

**Abstract**

This research explores the role of background music in commercial advertisements and its influence on consumer behaviour. Background music is a powerful marketing tool that helps create emotional connections, enhance brand identity, and capture audience attention. The study aims to examine how different types of  viewers' emotions, recall, and purchasing decisions. Through surveys and content analysis of selected advertisements, the research investigates the psychological and emotional effects of background music on consumers. The findings are expected to show that well-chosen background music increases advertisement effectiveness by making messages more memorable and appealing, ultimately influencing consumer attitudes and buying behaviour.

**Keywords:** Background Music, Marketing, Consumer, Commercial Advertisement

**දේශීය සිනමාවෙහි නිර්මාණාත්මක පරිවර්තනයක් සහ නිර්මාණාත්මක සමතුලිතතාවයක් පවත්වා ගැනීම සඳහා කෘත්‍රිම බුද්ධි තාක්ෂණය (AI) භාවිතය**

අයි. ජේ. සී. තිසේරා - DD/20/097
නර්තන රංගකලා ඉතිහාසය සහ සිද්ධාන්ත අධ්‍යයනාංශය, නර්තන හා නාට්‍ය කලා පීඨය
janith2025research@gmail.com

**සංක්ෂිප්තය**

තාක්ෂණය සමඟ ඉදිරියට යන සිනමා කර්මාන්තය සඳහා ද කෘත්‍රිම බුද්ධි තාක්ෂණය භාවිතා කිරීම මේ වන විටත් ආරම්භව ඇත. මෙම පර්යේෂණයේ පර්යේෂණ ගැටලුව වන්නේ, දේශීය සිනමාව සඳහා කෘත්‍රිම බුද්ධිය (AI) බද්ධ කිරීම මගින් ඇතිවන ධනාත්මක නිර්මාණාත්මක පරිවර්තනයක් සහ දේශීය සංස්කෘතික අනන්‍යතාවයට එල්ල විය හැකි ප්‍රතිවිරෝධතා අතර නිර්මාණාත්මක සමතුලිතතාවයක් පවත්වා ගන්නේ කෙසේ ද යන්නයි. මෙහි ඇති කාර්යක්ෂමතාව සහ වේගය නිසා මිනිසාගේ නිර්මාණශීලීත්වය යටපත් වීම වැළැක්වීම හා කෘත්‍රිම බුද්ධිය (AI) මෙවලමක් ලෙස පමණක් භාවිතා කිරීමත් මගින් සංස්කෘතික අනන්‍යතාවයට එල්ල විය හැකි ප්‍රතිවිරෝධය අවම කර ගත හැකිය යන්න මෙම පර්යේෂණයේ උපන්‍යාසයකි. ගුණාත්මක සහ ප්‍රමාණාත්මක පර්යේෂණ ක්‍රමවේද භාවිත කෙරේ. සිනමාකරණය සඳහා කෘත්‍රිම බුද්ධිය මෙවලමක් ලෙස සීමා කිරීම, විශේෂිත දේශීය දත්ත පුහුණුවක් කෘත්‍රිම බුද්ධිය සඳහා පවත්වා ගැනීම, කෘත්‍රිම බුද්ධිය මගින් රැකියා අහිමිවීමේ අවදානම කළමනාකරණය, සදාචාරාත්මක සහ නෛතික රාමුව ශක්තිමත් කිරීම වැනි කරුණු පිළිබඳ මෙම පර්යේෂණයේ දී සාකච්ඡා කෙරුණු අතර දේශීය දත්ත පුහුණුවක් කෘත්‍රිම බුද්ධිය සඳහා පවත්වා ගැනීම කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරිණි. දැනට ශ්‍රී ලාංකේය සිනමාවේ දේශීය දත්ත පුහුණුවක් කෘත්‍රිම බුද්ධිය පවත්වා ගැනීම සඳහා නිශ්චිත දත්ත පද්ධතියක් නොමැත. නිශ්චිත දත්ත පද්ධතියක අවශ්‍යතාවය දේශීය සිනමාවේ උන්නතිය උදෙසා අත්‍යවශ්‍ය සාධකයකි. එම අඩුව යම් තරමකට හෝ පිරවීම මෙම පර්යේෂණයෙන් අපේක්ෂා කෙරේ.

**මුඛ්‍ය පදඃ** කෘත්‍රිම බුද්ධි තාක්ෂණය, සංස්කෘතික අනන්‍යතාවය, නිර්මාණාත්මක සමතුලිතතාවය, දේශීය සිනමාව.

# STUDENT RESEARCH SYMPOSIUM 2025

"RESONATING RESEARCH IN MUSIC AND CREATIVE ARTS."

ISBN 978-624-5785-38-4

9 786245 785384

ARCHIVAL & RESEARCH UNIT

**ORGANIZED BY**

C.DE.S. KULATHILAKE ARCHIVAL AND RESEARCH UNIT,

FACULTYOF MUSIC, UNIVESSITY OF THE VISUAL AND PERFORMING ARTS,

COLOMBO 07, SRI LANKA.